**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය - 2018**
-------------------------------------------------------------

## 1.1 මතය ව්‍යාචනය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 12 වන ඡේදය ප්‍රකාරව අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.21,728,717 ක් වූ බොල් ණය වෙන්කිරීම සඳහා අදාළ කරගෙන තිබුණු නිශ්චිත ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. එසේම ප්‍රමිතියේ 47 ඡේදය ප්‍රකාරව අස්තිත්වයක් විසින් ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි වරද සිදුවූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවත් එපරිදි කටයුතු කිරීමෙන් තොරව 2017 වර්ෂයට අදාළ රු.20,764,303 ක් වූ පෙර වර්ෂ ගැලපීම් හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයට ගලපා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 213,675,861 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව සම්පූර්ණයෙක් ක්ෂය කර ඇති නමුත් දැනටමත් භාවිතාකරණ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.3,269,229 ක් වුවද එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ රු.11,897,204 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.8,627,975 කින් වැඩියෙන් දක්වා තිබුණි. එසේම 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු.2,821,082 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම වටිනාකම රු.13,630,190 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ලැබිය යුතු පොලී රු.10,809,108 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර තැන්පත් පොලී නිවැරදිව ගණනය කර උපචිත පදනම මත ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර තැන්පත් ශේෂය රු.40,398,589 ක් වුවද බැංකු ශේෂ සනාථ කිරීම් අනුව එම වටිනාකම රු.37,483,793 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු රු.2,914,796 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර තැන්පතු වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 3 වගන්තිය අනුව ගෙවා ඇති ආර්ථික සේවා බදු වර්ෂ 3කට වඩා පැරණි නම් ගෙවිය යුතු ආදායම් බදු මුදලින් අඩු කළ නොහැකි බව දක්වා තිබුණද 2013 වර්ෂයේ සිට පැවත එන ආර්ථික සේවා ගාස්තු රු.679,535 ක් ලැබිය යුතු ආදායම් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ආර්ථික සේවා බදු නිවැරදි ලෙස ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු.844,352,325 ක් වූ කෙරිගෙන යන වැඩ තුළ ඇතුළත් වැඩ නිමකරන ලද ව්‍යාපෘති 21 කට අදාළ පිරිවැය රු.779,914,195 ක වත්කම් ප්‍රාග්ධන ගතකර නොතිබුණි. ඒ හේතුවෙන් එම වත්කම්වලට අදාළව ක්ෂය රු. 19,497,854 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය සඳහා අනෙකුත් ස්ථාවර වත්කම් ක්ෂයවීම්ද රු.29,065,594 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර වත්කම් ක්ෂය වියදම නිවැරදිව ගණනය කර ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| **අයවිය යුතු ශේෂයන්** | | | | | |
| (i) ශ්‍රී ලංකා වොලිබෝල් සංගමය | 3,479,608 | 987,449 | 2,492,159 | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නොසැසඳුණු ශේෂයන් හඳුනාගෙන නිවැරදිව ගිණුම්වල ගැලපීම් කළ යුතුය. |
| (ii) ශ්‍රී ලංකා ක්‍රිකට් | 13,953,845 | 13,573,845 | 380,000 | | |
| (iii) ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය | 1,903,798 | 121,358 | 1,782,440 | | |
| | **19,337,251** | **14,682,652** | **4,654,599** | | |
| (iv) සේවක ණය | 27,521,733 | 27,313,252 | 208,481 | | |
| (v)ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 1,758,165 | 0 | 1,758,165 | | |
| **ගෙවිය යුතු ශේෂ** | | | | | |
| (vi)පෞද්ගලික සමාගමකට ගෙවිය යුතු | 3,118,902 | 3,832,044 | 713,142 | | |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (i)වෙළඳ ණයගැතියෝ | 39,995,540 | ගිණුම් 82 කට අදාළ ශේෂ සනාථ කිරීම් | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමාණවත් හා ප්‍රවීණ විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය |
| (ii)වෙළඳ ණයගැතියෝ | 987,703 | කාල විශ්ලේෂණ | | |
| (iii)මීටර් 400 ධාවන පථය සඳහා ගෙවිය යුතු මුදල | 13,713,615 | ශේෂ සනාථ කිරීම් | | |
| (iv)ආර්.ප්‍රේමදාස ක්‍රීඩාංගනයේ තොග | 2,149,491 | භෞතික සත්‍යාපන වාර්තා | | |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂවල එකතුව රු.39,995,539 ක් වූ අතර එයින් වර්ෂ 01 ට වඩා පැරණි ණයගැතියන් 101 දෙනෙකුගෙන් අයවිය යුතු රු.31,665,703 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අයවිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2012 සහ 2013 වර්ෂ සඳහා ගෙවිය යුතු එකතුකළ අගය මත බදු වෙනුවෙන් රු.8,939,262 ක් වෙන්කර තිබුණද එම බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට හෝ ගිණුම්වල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු මුදල් අප්‍රමාදව නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) වර්ෂ 11 ක කාල පරිච්ඡේදයක සිට කොළඹ මහා නගර සභාවට ගෙවිය යුතු රු.1,124,068 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු මුදල් අප්‍රමාදව නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br><br>(i) මුදල් රෙගුලාසි 371 (2) (ඇ) | කාර්යය නිමකළ වහාම ලබාගත් අත්තිකාරම් නිරවුල් කළ යුතු වුවත් 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ගෙවන ලද රු.102,258 ක් වූ අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ මුදල් රෙගුලාසිය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ii) මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ මාස 6 ඉකුත් වූ එකතුව රු.82,933 ක් වූ චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් මෙම රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ මුදල් රෙගුලාසිය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය |
| (iii) මුදල් රෙගුලාසි 880 හා 891(1) | අධිකාරියේ මුදල් බාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඇප ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ මුදල් රෙගුලාසිය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය |
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | අධිකාරියේ වාහන 15 ක් සඳහා 2013 වර්ෂයෙන් පසු චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 80,179,897 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 154,960,050 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.74,780,153 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමේ අඩුවීමට මෙහෙයුම් ආදායම රු.18,321,994 කින් වැඩිවීම සහ රාජ්‍ය ප්‍රදාන රු.58,940,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ජංගම අනුපාතය 1.55 සිට 2.42 දක්වා වැඩි වී තිබුණි. ඒ අනුව අධිකාරියේ කෙටි කාලීන බැරකම් පියවීමේ හැකියාව ඉකුත් වර්ෂයට සාපේක්ෂව වර්ධනය වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වනවිට තාක්ෂණික,සැලසුම්,මාධ්‍ය,විදුලි යාන්ත්‍රික හා උපදේශක යන අංශවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 05 ක් ඇතුළුව මුළු පුරප්පාඩු 76 ක් පැවති අතර එම පුරප්පාඩු පිරවීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |

## 3.2 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බාහිර ආයතන 02 කට අයත් මෝටර් රථයක් හා ගිලන් රථයක් විධිමත් පරිදි පවරානොගෙන අධිකාරියේ කටයුතු සඳහා භාවිතා කර තිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ | වත්කම් විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ 8 (1) වගන්තිය ප්‍රකාරව ඉදිරි මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර අයවැය ලේඛනය පිළියෙල කර එය අධිකාරියේ පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන සමග විගණනයට ඉදිරිපත් කළ අයවැය ගත ආදායම්, වියදම් හා තථ්‍ය ආදායම්, වියදම් අතර සැසඳීමේදී ආදායම් විෂයයන් 15 කට අදාළව සියයට 14 සිට සියයට 133 දක්වාද වියදම් විෂයයන් 20 කට අදාළව සියයට 12 සිට සියයට 608 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අයවැය ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කර පාලන කාරකයන් ලෙස යොදා ගත යුතු අතර විචලනයන් පිළිබඳව කාලීනව සැලකිල්ලට ගත යුතුය. |